“මිනිසා තම කල්යාණ මිතුරාගේ දහම මත සිටියි. එබැවින් ඔබ අතරින් කිසිවකු හෝ වේවා තම කල්යාණ මිතුරන් වන්නේ කවුරුන්දැයි මැනවින් බලත්වා!”

සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “මිනිසා තම කල්යාණ මිතුරාගේ
දහම මත සිටියි. එබැවින් ඔබ අතරින් කිසිවකු හෝ වේවා තම කල්යාණ මිතුරන් වන්නේ කවුරුන්දැයි මැනවින් බලත්වා!” [حسن] [رواه أبو داود والترمذي وأحمد]

පුද්ගලයෙකු තම හැසිරීම් සහ පුරුදු තුළ ඔහුගේ කළ්යාන මිතුරා සහ සහකරුට සමාන බවත්, මිත්රත්වය සදාචාරයට, හැසිරීමට සහ ක්රියාවන්ට බලපාන බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිලි කළහ. මේ හේතුව නිසා හොඳ මිතුරෙකු තෝරා ගැනීමට එතුමාණෝ මඟ පෙන්වූහ. මක්නිසාද යත් ඔහු තම මිතුරාට විශ්වාසය, යහමඟ සහ යහපත වෙත මඟ පෙන්වන අතර ඔහු තම මිතුරාට උදව් කරුවකු වන බැවිනි.

https://www.sunnah.global/hadeeth/si/show/3122